**ශීර්ෂය 138 - දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

**මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.**

**1 කොටස -අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**
**2 කොටස - එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

**1 කොටස**

**දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

---

**1 අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුව |
|---|---|
| 220 | ආයුර්වේද දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,770,400,000 ක්වු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.1,068,844,373 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු.166,407,763 ක් හා රු.535,147,864 ක් හෙවත් සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 35 ක් හා සියයට 41 ක් වි තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2013 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| 138 | 473,930,000 | 307,522,237 | 166,407,763 | 35 |
| 220 | 1,296,470,000 | 761,322,136 | 535,147,864 | 41 |
| එකතුව | 1,770,400,000 | 1,068,844,373 | 701,555,627 | 40 |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 13801 | 11,000,000 | 7,978,083 | 4,000,000 | 6,346,532 | 36,000,000 | 21,117,515 |
| 22001 | 32,000,000 | 25,148,297 | 21,000,000 | 27,637,920 | 172,000,000 | 77,242,210 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.13,723,680 ක් විය. විස්තර පහත දැක්වේ

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 6000/0000/00/0015/0050/000 | 280,363 |
| ආයුර්වේද දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0101/000 | 13,443,317 |
| එකතුව | | 13,723,680 |

## 2 කොටස

----------

**එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

---

**1. ශීර්ෂය 138 - දේශිය වෛද්‍ය අමාත්‍යාංශය**

**1.1 විගණන විෂය පථය**

දේශිය වෛද්‍ය අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 22 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සෙයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන නිරීක්ෂණය**

**----------------------**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.13 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

---------------------------------------------

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණි.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| (i) ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) හානි හා පාඩු ලේඛනය | මුදල් රෙගුලාසි 110 |

**(ආ) අයවැය විචලනය**

**------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයන් 2 ක් සඳහා සළසා තිබුණු රු. 4,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) පුනරාවර්තන වියදම සඳහා වෙන්කළ ප්‍රතිපාදනයෙන් සියයට 40 කට වඩා ඉතිරි වී තිබූ අවස්ථා 12 ක් වූ අතර එහි වටිනාකම රු.26,337,057 ක් විය.

(iii) මුලධන වියදම සඳහා වෙන්කළ ප්‍රතිපාදනයෙන් සියයට 40 කට වඩා ඉතිරි වී තිබූ අවස්ථා 09 ක් වූ අතර එහි වටිනාකම රු.59,619,473 ක් විය.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

**--------------------**

2013 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු 280,363 ක් වූ අතර 2011 ඔක්තෝබර් 25 දි තැන්පත් කළ රු.10,000 ක මුදල සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම**

-------------------------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i). විෂය අංක 13801 දරන අත්තිකාරම් ගිණුම් පිළිබද 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිගහිට තිබුණු ශේෂවල එකතුව රු.21,117,515 ක් වූ අතර එයින් රු. 12,000 ක හිඟහිටි ශේෂ අය කර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii). 2005 ජූලි 15 දින ස්ථාන මාරු වීම් ලබා ගිය නිලධාරියෙකුගේ රු.288,618 ක් වූ ණය ශේෂයට අදාල ණය ලිපිගොනුව විගණන කටයුතු සඳහා ඉදිරිපත් කර නොතිබුණි. එසේම එම ණය ශේෂය නිලධාරියා මාරු වී ගිය අමාත්‍යාංශය වෙතින් පියවා ගැනිමට 2014 ජුනි 10 දින වන විටත් අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(iii). නිලධාරීන් 61 දෙනෙකුට එකතුව රු.5,867,744 ක ආපදා ණය මුදල් ගෙවා තිබුණත්, ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4:3:2 වගන්තිය ප්‍රකාරව එම ණය ශේෂ සම්බන්ධයෙන් අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(iv) අමාත්‍යාංශය විසින් ආපදා ණය ගෙවීමේදී ණයකරුගේ සහ ඇපකරුගේ ඇපවීම් විස්තර ඇතුළත් ණය ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

## 1.4 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

---------------------------------------

### 1.4.1 අභ්‍යන්තර විගණනය

----------------------

2012 හා 2013 වර්ෂ සදහා අමාත්‍යාංශයට අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොසිටි අතර අභ්‍යන්තර විගණන ඒකකය ක්‍රියාත්මක කර නොතිබුණි.

### 1.4.2 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර 3 ක් පවත්වා තිබුණි.

## 1.5 වත්කම් කළමනාකරණය

--------------------------

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| **ගොඩනැගිලි** | | |
| හෝමියෝපති රෝහලේ මුළුතැන්ගෙය සඳහා ඉදිකර ඇති ගොඩනැගිල්ල | 01 | අවු. 02 |
| මහින්ද රාජපක්ෂ හෝමියෝපති වෛද්‍ය විද්‍යාලය සඳහා ලබා දී ඇති ගොඩනැගිල්ල | 01 | අවු. 04 |

මුළුතැන්ගෙය සඳහා භාවිතා කරන ශීතකරණ (Hitachi) 02ක්, ලිප් 3 ගෑස් උදුන් 02ක්, ලොකු ගෑස් උදුනක්, ගෑස් සිලින්ඩර් (ලොකු) 02ක්, රයිස් කුකර් 01ක්, විදුලි හිරමණයක් සහ මුළුතැන්ගෙයි ප්‍රයෝජනයට ගන්නා අයිතම 33ක් වසර 03ක සිට නිෂ්ක්‍රීයව පවතින අතර රෝගීන්ට අවශ්‍ය ආහාර පිටතින් මිලදී ගැනීම සිදු කර තිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩලය/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2014 නොවැම්බර් මාසය දක්වාම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර 2012 වර්ෂයේ දී භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2014 නොවැම්බර් මස ඉදිරිපත් කර තිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

අමාත්‍යාංශය සතු ලොරි රථයක් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙත මුදාහැර තිබුණි.

**(ඈ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් 2010 මැයි 25 දින සිට දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ පරිහරණයට ලබාගෙන ඇති වෑන් රථය 2014 වර්ෂය වන විටත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට නැවත භාර දී නොතිබුණි.

**(ඉ) බේරුම් නොකළ බැරකම්**

**------------------------- --**

මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව වැය විෂයයක් යටතේ සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය රු.150,711 ක් වී තිබුණත්, එම ඉතිරිය රු.58,549 කින් ඉක්මවා රු.209,260 ක බැරකම්වලට එළඹ තිබුණි.

**1.6 අනුකූල නොවීම**

**-----------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**-----------------------------------------------------**

1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය සතු සංචිත වාහනවල ඉන්ධන දහනය සෑම මාස 06 කට වරක් පරීක්ෂා කර නොතිබුණි.

**1.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

**----------------------------------------**

අක්කර 05 ක පමණ භූමි ප්‍රමාණයකින් යුත් වැලිසර රජයේ හෝමියෝපති රෝහල පිහිටි ඉඩමෙහි 2003 වර්ෂයේ ඉදිකිරීම් කටයුත ආරම්භ කළ නව ගොඩනැගිල්ල සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 වර්ෂයේ ආරම්භ කළ අක්කර 05 ක පමණ භූමි ප්‍රමාණයකින් යුත් වැලිසර රජයේ හෝමියෝපති රෝහල පිහිටි ඉඩම 2013 දෙසැම්බර් 31 දින වන විටත් අමාත්‍යාංශයට පවරා ගෙන නොතිබුණි. එම භූමියේ ඉදි කරන නව ගොඩනැගිල්ල 2012 ජූලි 23 දිනැති අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ තීරණ අංක 02 මගින් රුපියල් මිලියන 79 කට ඉදිකිරිම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට පවරා තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුමට අනුව මෙම කොන්ත්‍රාත්තුව සඳහා මිල ගණන් කැඳවීම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සිදු කළ යුතු වුවත්, එසේ විවෘත මිල ගණන් කැඳවීමකින් තොරව සහ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියකින් තොරව එම කොන්ත්‍රාත්තුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ලබා දී තිබුණි.

(ආ) 2014 මාර්තු 19 දිනැති හෝමියෝපති රෝහලේ කාර්යභාර වෛද්‍ය නිලධාරිනියගේ ලිපියට අනුව ඉහත සඳහන් ගොඩනැගිල්ල ඉදිකිරීමේ පළමු අදිරය 2014 ජනවාරි 03 දින අවසන් කිරිමට අපේක්ෂිතව තිබුණද, 2014 අගෝස්තු මාසය වන විට එම කාලය මාස 06 කට වැඩියෙන් ඉක්මවා තිබුණත් එය නිම කිරිමට නොහැකි වී තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරයාගේ සහාය මෙම ඉදිකිරීම සඳහා ලබාගෙන නොතිබුණි.

(ඇ) 2014 මාර්තු 20 දිනැති අංක 03/02/06 දරන දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ගණකාධිකාරීගේ ලිපියට අනුව මෙම ඉදිකිරිම සඳහා 2012 හා 2013 වර්ෂවලදී රු.26,350,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර එයින් රු.25,088,077 ක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් වියදම් කර තිබුණි. නමුත් නිමකළ වැඩ ප්‍රමාණයේ ප්‍රගතිය වාර්තා වී නොතිබුණු අතර භෞතික ප්‍රගතිය සහ සමස්ථ වියදම් සංසන්ධනය කිරිමක් සිදු වී නොතිබුණි.

(ඉ) 2014 මාර්තු 20 දිනැති ඉහත ලිපියට අනුව මේ දක්වා නිම කළ වැඩ පිළිබඳව ගොඩනැගිලි ප්‍රධාන ඉංජිනේරු වාර්තාව ලබා ගැනිමට යෝජනා කර තිබුණි. එහෙත් එවැනි වාර්තාවක් විගණන දිනය වූ 2014 අප්‍රේල් 28 දින වන විටත් ලබා ගෙන නොතිබුණි.

(ඊ) ගිවිසුමට අනුව වැඩ බිම් අධීක්ෂණය හා එහි පාලනය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සිදුකළ යුතු අතර එසේම දේශීය වෛද්‍ය අමාත්‍යාංශය (Client) හා ඉංජිනේරු සංස්ථාව (Contractor) කැඳවා මාසික ප්‍රගතිය සමාලෝචනය කළ යුතු වුවත් එසේ සිදුකළ බවට සාක්ෂි ලිපිගොණුවේ නොතිබුණි.

(උ) ගිවිසුම් ප්‍රකාරව මෙම නිවාස සංකීර්ණයේ ඉදිකිරීමේ කටයුතු 2014 දෙසැම්බර් 31 දින අවසන් කිරීමට නියමිත බැවින් මෙම ඉදිකිරීම්වල වර්තමාන ප්‍රගතිය විගණනය වෙත වාර්තා කර නොතිබුණි.

## 1.8 කාර්යසාධනය

----------------

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

--------------------------------------------------

අමාත්‍යාංශය ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව ආයුර්වේද සංරක්ෂණ සහා බල ගැන්විම යටතේ තෝරා ගත් සංරක්ෂණ සභාවල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම 2013

දෙසැම්බර් මස වන විට සිදු කළ යුතු වුවත්, 2014 ජනවාරි 26 දින වන විටත් ලැබී ඇති ව්‍යාපෘති ඇගයීමට ලක් කර හෝ නොතිබුණි.

(ii) 2014 නොවැම්බර් මස වන විටත් අමාත්‍යාංශය පිහිටි රෝහල් භූමියේ ඉදි කරන පෝෂණ මන්දිරයේ වැඩ අවසන් කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ පෝෂණ වැඩසටහන් 12ක් පැවැත්වීමට සැළසුම් කර තිබුණද, කොළඹ සහ බදුල්ල ප්‍රදේශයේ වැඩසටහන් 02 ක් පමණක් පවත්වා තිබුණි.

**(ආ) ඖසු උයන් නඩත්තු කිරිම.**

----------------------------

පර්යේෂණ ඖසු උයන් නඩත්තු කිරීම හා ප්‍රවර්ධනය කිරීම අමාත්‍යාංශයේ කාර්යයක් වේ. අමාත්‍යාංශය යටතේ ඇති ඖසු උයන් 02 ක් (වෙදගම ඖසු උයන අක්කර 44, මැදිරිගිරිය ඖසු උයන අක්කර 25) හා ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ පවතින ඖසු උයන් 05 ක් (නීලබැම්ම අක්කර 25, මැදවච්චිය දංගොල්ල අක්කර 50, පදවිය ඖසු උයන අක්කර 25, හිවල් කඳුර අක්කර 100, පිල්ල අබන්පොල අක්කර 69) වල් බිහිවී පැවැති අතර ඒවායේ නඩත්තු කිරීමක් සිදුකර නොතිබුණි.

**(ඇ) ජංගම අලෙවි රථ ලබාදීමේ වැඩ සටහන**

--------------------------------------------

දේශීය ආහාර ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් අමාත්‍යාංශය විසින් ගිවිසුම්ගතව හා ගිවිසුම් රහිතව රු.391,105 ක් වියදමක් කර ජංගම අලෙවි රථ 11 ක් විවිධ පුද්ගලයන්ට ලබා දී තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදු කළ විගණන පරික්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂනයන් කරනු ලැබේ.

(i). අමාත්‍යාංශයෙන් එම ජංගම අලෙවි රථ ලබාගත් පුද්ගලයන් දේශීය ආහාර ප්‍රවර්ධන වැඩපිලිවෙලට අනුකූලව කටයුතු කෙරේද යන්න පිළිබඳව පසු විපරම් කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii). ජංගම අලෙවි රථ ලබාදීමේ ගිවිසුමේ පැවරීමේ කොන්දේසි 05ට අනුකූලව ජංගම අලෙවි රථ වෙතින් උපයන ආදායමෙන් මසකට රු.500 බැගින් දේශීය වෛද්‍ය සංවර්ධන අරමුදලට බැර කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ජංගම අලෙවි රථ ලබාගත් පුද්ගලයන් එසේ කටයුතු කර නොතිබුණි.

**(ඈ) පෝෂණ මන්දිර වැඩ සටහන**

------------------------------

දේශීය ආහාර පාන ප්‍රචලිත කිරීම තුළින් ජනතාවගේ පෝෂණ තත්ත්වය ඉහල නැංවීමේ අරමුණින් 2007 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රු.1,842,605 ක් වැයකර පෝෂණ මන්දිර 05ක් ඉදිකර තිබුණද ඒවා ඉදිකිරීමේ පරමාර්ථය ඉටු වනවාද ඒවා වර්තමානයේ ක්‍රියාත්මක වනවාද යන්න සහ ඒවායේ කාර්යසාධන තත්ත්වය පිළිබඳව සොයා බැලීමට කටයුතු කර නොතිබුණි.

2012 සැප්තැම්බර් 10 දින සිට 2013 ජුනි 05 දින දක්වා කාලය තුළ අවසන් කිරීමේ අරමුණින් නයිනතිවු දූපතේ රු.3,449,546 ක වියදමින් ඉදිකරන ලද පෝෂණ මන්දිරය සහ ආයුර්වේද බෙහෙත් ශාලාව 2013 ජුනි 10 දින වැඩ අවසන් කර භාරදී තිබුණි. එසේ වුවද අමාත්‍යාංශය විසින් එහි වර්තමාන තත්ත්වය පිළිබඳව සොයා බලා පරීක්ෂා කර නොතිබුණි.

**(ඉ) හෙල වෙද ගෙවල් වැඩසටහන**

--------------------------------

2005 සැප්තැම්බර් 22 දිනැති අමං/05/1301/022/022 අංක දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව යටතේ පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් මුහුණපාන ප්‍රධාන ගැටළුවක් ලෙස දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් හඳුනාගනු ලැබූ නේවාසික ප්‍රතිකාර ලබා දීමට පහසුකම් සැපයීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. මේ යටතේ අමාත්‍යාංශය හෙල වෙද ගෙවල් 42 ක් ඉදි කර තිබුණු අතර එයින් 40ක් සඳහා රු.40,933,388ක් වැය කර තිබුණි. එක් වෙද ගෙයක් ආරක්ෂක අමාත්‍යාංශයේ වියදමින් ඉදිකර තිබුණි. බුත්තල දැයට කිරුල වැඩසටහන යටතේ හෙල වෙද ගෙයක් ඉදිකර තිබුණු අතර එහි ඇස්තමේන්තුගත වියදම රු.813,325 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 අගෝස්තු මාසයේදී පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන් මාර්ගයෙන් අමාත්‍යාංශය විසින් හෙල වෙද ගෙවල්වල වර්තමාන ප්‍රගතිය කැඳවා තිබුණි. ඒ අනුව හෙල වෙද ගෙවල් 32 කින් එකතුව රු.17,365,044 ක් වැය කර ගොඩනැගූ හෙල වෙද ගෙවල් 16 ක ප්‍රගතිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ii) එකතුව රු.10,276,337 ක් වැය කර ඉදිකළ වෙද ගෙවල් 09ක තොරතුරු කැඳවා නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට එකතුව රු.1,814,946 ක වියදමින් ඉදිකළ වෙද ගෙවල් 02ක් ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය විය. අමාත්‍යාශය විසින්

රජයේ මුදල් වැයකර ඉදිකර තිබුණු උක්ත ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය ලිපියක් මගින් විමසන ලද අතර එහිදී ප්‍රතිචාර නොදක්වන හෙල වෙද ගෙවල් සම්බන්ධව ප්‍රමාණවත් මැදිහත්වීමක් අමාත්‍යාංශය විසින් සිදුකර නොතිබුණි.

**(ඊ) සැලැසුම් කිරීම**

**----------------**

**වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම, සංයුක්ත සැලැස්මට අනුකූල නොවීම.**

**---------------------------------------------------------------------**

අමාත්‍යාංශයේ 2012–2016 කාලපරිච්ඡේදය සඳහා සකස් කර තිබුණු සංයුක්ත සැලැස්මේ, හෝමියෝපති රෝහල් භූමියේ ඉදිකරන නේවාසිකාගාර සංකීරණය සහ හෝමියෝපති වෛද්‍ය සභාවේ පරිපාලන ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම යන ක්‍රියාකාරකම් ඇතුළත් කර නොතිබුණි. 2013 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මේ එම ක්‍රියාකාරකම් ඇතුළත් කර තිබූ අතර භෞතිකව ද එම කටයුතු ඉටු කර තිබුණි.

## 1.9 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

**-------------------------------------------**

**ගැලපුම් කළයුතු ශේෂය**

**-------------------------**

අමාත්‍යාංශය විසින් 2013 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුනු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ, කල් ඉකුත් වූ රු.13,666 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.

## 1.10 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

**------------------------------------------**

අමාත්‍යාංශය විසින් සිදු කර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ඇමතු කාර්මික තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ, 2013 නොවැම්බර් 20 දිනැති ලිපියේ උපදෙස් පරිදි, රු.1,436,341 ක් වටිනා පැකට් 7,981 ක ලැක්ටෝස් තොගය 2014 මාර්තු 05 දින වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. 2014 මාර්තු 05 දින සිදුකළ විගණන පරීක්ෂණයෙන් පසුව මෙම ලැක්ටෝස් තොගය අපහරණය කර තිබුණද, මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 102 ප්‍රකාරව පරීක්ෂණ කටයුතු සිදුකර අලාභයට වගකිව යුතු නිලධාරින් නිර්ණය කර නොතිබුණි.

(ආ) හෝමියෝපති වෛද්‍ය සභාවෙන් 2012 මැයි මාසයේ දී රෝහල වෙත ලැබුණු ඖෂධ බෝතල් 927 ක තොගයක් භාවිතා කර නොතිබුණු අතර, අනවශ්‍ය ලෙස විශාල ඖෂධ

තොගයක් රෝහලට ලබා දී තිබෙන බවත් මෙම ඖෂධ භාවිතා කළ හැකිද යන්න පරික්ෂා කිරිමක්ද සිදු කර නොතිබුණි.

(ඇ) කල් ඉකුත්වීමේ දිනය 2012 නොවැම්බර් ලෙස සඳහන් ඖෂධ බෝතල් 367ක් විගණිත දිනය වු 2014 මාර්තු 05 දින වන විට භාවිතා කරමින් පැවතුණි.

## 1.11 අවිධිමත් ගනුදෙනු

---------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) කිසියම් කාර්යයක් සිදු කිරීමට ප්‍රථම ඒ සම්බන්ධව සැලැසුම් කිරීමක් කර ඒ අනුව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වුවද, අමාත්‍යාංශය විසින් 2013 ජනවාරි 01 දින සිට 2013 නොවැම්බර් 20 දින දක්වා අවස්ථා 90 කදී ගෙවන ලද රු.1,335,945ක අත්තිකාරම් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(ආ) අත්තිකාරම් ලබා දීමේදී වගකිවයුතු නිලධාරියෙකු විසින් ඇස්තමේන්තුවක් සකස් කළ යුතු අතර එය අනුමත කිරීමෙන් පසු ගෙවීම් කළ යුතු වුවත්, එසේ සිදු නොකර අත්තිකාරම් ඉල්ලුම් කරන නිලධාරියා විසින්ම සකස් කළ ඇස්තමේන්තුව මත පදනම්ව, අමාත්‍යාංශය විසින් අවස්ථා 10කදී රු.185,000 ක අත්තිකාරම් ගෙවා තිබුණි.

## 1.12 පාඩු හා හානි

-------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳව නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) හෝමියෝපති රෝහලේ තාප්පයේ කොටසක් කඩා වැටීම**

**---------------------------------------------------------**

හෝමියෝපති රෝහලේ තාප්පය 2010 වර්ෂය තුළදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ලවා පිළිසකර කරවාගෙන තිබුණු අතර එය 2013 මැයි 26 දින විදුලි බල සමාගමකට අයත් විදුලි කණුවක් මතට කඩා වැටී තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 104 (1) අනුව පාඩුවක් හෝ අලාභහානියක් හෝ සිදුවූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැන ගැනීමටත් එයට වගකිව යුත්තන් නිශ්චය කිරිමත් සඳහා පරීක්ෂණ ආරම්භ කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් පරීක්ෂණ මණ්ඩලය මාසයක ප්‍රමාදයකින් පසුව එනම් 2013 ජුලි 03 දින පත්කර තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 104 (3) ප්‍රකාරව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරිමට දින 7කට වැඩි ප්‍රමාදයක් සිදු වේ යැයි අපේක්ෂා කරන්නේ නම් ප්‍රාරම්භක වාර්තාව වහාම

ඉදිරිපත් කළ යුතු වුවද, පාඩුව සිදුවී ප්‍රාරම්භක වාර්තාව ඉදිරිපත් කිරිමට මාස 3 1/2 ක කාලයක් ගත කර තිබුණි.

(iii) මෙම පාඩුවට අදාල ප්‍රාරම්භක වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(iv) මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව ඉදිරිපත් කළ පූර්ණ වාර්තාවට අනුව මෙම අලාභය සම්බන්ධයෙන් ගොඩනැගිලි දෙපාර්තුමේන්තුව සම්පූර්ණ ලෙස වගකිව යුතු බව නිගමනය කර තිබුණි. එසේ වුවත් 2013 ඔක්තෝබර් 21 දිනැති අංක 02/05/18 දරන දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) ගේ ලිපියෙන් හෝමියෝපති රෝහලේ නව බැම්ම ඉදිකිරිමේ කොන්ත්‍රාත්තුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ලබාදිම සඳහා තාප්පය කඩා වැටිමෙන් සිදුවූ අලාභයේ වගකීමෙන් එම දෙපාර්තමේන්තුව නිදහස් බව දැක්වෙන වාර්තා ලබා ගන්නා ලෙසද කාර්යභාර වෛද්‍ය නිලධාරිනියට දන්වා තිබුණි.

(v) අමාත්‍යාංශය විසින් නැවත වරක් 2013 නොවැම්බර් 7 දිනැති මුලික විමර්ෂන 08 දරන දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ලිපිය මගින් නැවත පරික්ෂණ මණ්ඩලයක් පත්කර තිබුණි. එම කමිටුව විසින්ද මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

(vi) 2014 අප්‍රේල් 21 දිනැති මු.වි.1/2014 අංක දරන ලිපිය මගින් නව කමිටුව විසින් ඉදිරිපත් කළ වාර්තාවට අනුවද පැති බැම්ම කඩා වැටීමේ වගකීම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව බව දක්වා තිබුණි. තාප්පය කඩා වැටීමෙන් විදුලි සමාගමක විදුලි කණුවට සිදුවූ රු.67,200 ක අලාභයට අමතරව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට තාප්පයේ එම කොටස සෑදීම වෙනුවෙන් ගෙවන ලද මුදලද ඇතුළත් විය යුතු බව විගණනයේදී නිරීක්ෂණය විය.

**(ආ) වාහන අලාභහානිය**

---------------------

අමාත්‍යාංශය විසින් ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන තිබුණු වාහනයක් 2013 වර්ෂයේදී අනතුරට ලක් වී තිබුණි. ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව විගණනයට වාර්තා කර නොතිබුණි. මෙම අනතුරට සම්බන්ධ අළුත්වැඩියා කිරිම් හෝ රක්ෂණ හිමිකම් ලැබීම් සම්බන්ධ කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 1.13 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳව තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ----------------- | --------- | ------------ | -------------- |

| | | | | |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 13 | 08 | 05 |
| (ii) | තෘතීයික මට්ටම | 02 | 01 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 378 | 85 | 293 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 36 | 35 | 01 |
| | | ------ | ---- | ---- |
| | **එකතුව** | **429** | **129** | **300** |
| | | === | == | == |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 300 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(ii) අමාත්‍යාංශයේ සේවක සංඛ්‍යාවට වැලිසර හෝමියෝපති රෝහලේ සහ අනුරාධපුර ප්‍රජා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් ඇතුළත් කර නොතිබුණි.

## 2. ශීර්ෂය 220 - ආයුර්වේද දෙපාර්තමේන්තුව

### 2.1 විගණන විෂය පථය

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 සැප්තැම්බර් 22 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය

මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2.3 විගණන නිරීක්ෂණය

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.15 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

### (ආ) අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). වැය විෂයයන් 16 ක් සඳහා සළසා තිබුණු රු.19,003,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii). වැය විෂයයන් 45 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 41 සිට සියයට 99 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### (ඇ) පොදු තැන්පත් ගිණුම

2013 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ තැන්පත් ගිණුමේ ශේෂය රු.13,443,317ක් වූ අතර, ඉන් වර්ෂ 2ක් ඉක්මවූ රු.477,334 ක් වූ තැන්පතු 19 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### (ඈ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). විෂය අංක 22001 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.5,445,347 ක් වූ අතර, එම හිගහිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii). කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා පාලන ගිණුමේ වර්ෂ අවසාන ශේෂය අතර රු.24,430 ක වෙනසක් වු අතර ඊට හේතු හඳුනාගෙන නොතිබුණි.

(iii). අත්තිකාරම් ගිණුමෙහි ණයහිමි උපලේඛනයෙහි හා ණය හිමියන් වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන ලේඛනයෙහි එක් නිලධාරියෙකුගේ ණය ශේෂයෙහි රු.16,028 ක වෙනසක් නිරික්ෂණය විය.

(iv). අත්තිකාරම් ගිණුමෙහි ඇතුළත් නොවූ 2013 දෙසැම්බර් මස අවකරන ලේඛනයෙහි සඳහන් රු.212,556 ක් වටිනා ශේෂයක් නිරික්ෂණය විය.

(v). වෛද්‍ය නිලධාරිනියකගේ උත්සව අත්තිකාරම් ශේෂයවූ රු.1,000 ක් අත්තිකාරම් ගිණුමෙහි ස්ථාන 2 ක සටහන් කර තිබුණි.

(vi). කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව දෙපාර්තමේන්තු සේවයේ නියුක්ත නිලධාරින්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය රු.78,245,462ක් වු අතර ඒ සම්බන්ධයෙන් සිදුකළ පරික්ෂාවේදී පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

- දකුණ, නැගෙනහිර, උතුරුමැද, බස්නාහිර සහ වයඹ පළාත් සභාවලට ස්ථාන මාරුවීම් ලබා ගිය ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් 10 දෙනාගෙන් 2012 දෙසැම්බර් 31 දිනට රු.223,555 ක ණය අයකර ගැනිමට තිබුණද, සමාලෝචිත වර්ෂයේදී රු.14,500ක ණය ශේෂය පමණක් අයකර ගෙන තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය වූ රු.209,055 ක් අයකරගෙන නොතිබුණි. ලේඛන පවත්වා නොතිබිම හේතුවෙන් මෙහි කාල විශ්ලේෂණයක් ලබාගැනිමට විගණනයට නොහැකි විය.
- අනියම් හා කොන්ත්‍රාත් පදනමට බඳවාගත් නිලධාරින් 05 දෙනෙකුගෙන් වර්ෂ ගණනාවක සිට අයවිය යුතු රු.5,000 ක උත්සව අත්තිකාරම් ශේෂය සමාලෝචිත වර්ෂයේදී නිරවුල් කර නොතිබුණි.

(vii) ස්ථාන මාරු වී පැමිණි නිලධාරින්ගේ ණය පිළිබඳ විස්තර අදාල ආකෘතිය ප්‍රකාරව පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. නිලධාරින් 43 දෙනෙකුට අදාල රු.7,179,080 ක ණය මුදලක් අයවිය යුතු බව සැසඳුම් ප්‍රකාශයේ දක්වා තිබුණ ද මෙම නිලධාරින් ස්ථානමාරු වී පැමිණි දිනය, නිලධාරින්ගේ තනතුර ආදී තොරතුරු සඳහන් කර නොතිබුණි.

(viii) වෙනත් ආයතන වලින් ස්ථාන මාරු වී පැමිණි නිලධාරින් 04ක ගෙන් අය විය යුතු රු.1,428,032ක ණය ශේෂයන් වර්ෂ ගණනාවක සිට නිරවුල් කර නොතිබුණි.

(ix) නිලධාරින් 16 දෙනෙකු දේපල ණය නිරවුල් කර තිබුණද ඔවුන්ගේ ඔප්පු දෙපාර්තමේන්තුව විසින් නිදහස් කර නොමැතිව සේප්පුවේ තබාගෙන තිබුණි.

(x) 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.256,200 ක් වූ දේපල ණය 3 ක් සඳහා හිමිකම් ඔප්පු ලබාගෙන නොතිබුණි.

(xi) දෙපාර්තමේන්තුව විසින් ගෙවන ලද රු.1,359,170 ක් වූ දේපළ ණය 6 ක් සඳහා ඇටෝර්නි බලය ලබා ගැනීමට ලිපි යවා ඇති නමුත් ලැබී නොතිබුණි.

(xii) දෙපාර්තමේන්තුව විසින් ගෙවන ලද රු.1,569,900 ක දේපල ණය සඳහා ඇටෝර්නි බලය ලබා ගෙන නොතිබුණි.

## 2.4 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

--------------------------------------

### 2.4.1 අභ්‍යන්තර විගණනය

------------------------

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන විමසුම් වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබූ අතර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

### 2.4.2 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර 3 ක් පමණක් පවත්වා තිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය

---------------------------

### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------------

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| බොරැල්ල ආයුර්වේද රෝහලට, 2011 සැප්තැම්බර් 26 දින රු.6,500,000 කට මිලදී ගත් විකිරණ යන්ත්‍රය | 01 | අවුරුදු 02 |
| 2011 මැයි 24 දින 1ක් රු.42,500 බැගින් රු.127,500කට මිලදී ගත් වේලාසටහන් යන්ත්‍ර | 03 | |

| | | |
|---|---|---|
| | 01 | අවුරුදු 02 |
| ඖෂධ වියලිමේ යන්ත්‍ර | 01 | |
| පෙති සාදන යන්ත්‍රය | 02 | |
| බෙහෙත් කලවම් කරන යන්ත්‍ර | | |

| | |
|---|---|
| විදුලිපංකා (බිමසිටුවන) | 01 |
| ඇළුමිනියම් කිරිගොටු (ලොකු) | 04 |
| ප්ලාස්ටික් කිරිගොටු (කුඩා) | 04 |
| ඇළුමිනියම් කිරිගොටු (කුඩා) | 02 |
| ස්ටීමර් උඩ කොටස් | 01 |
| ඩිකීස් (ලොකු) | 01 |
| ගෑස් ලිප් බර්නර් | 06 |
| විදුලි පන්දම් (ආරෝපණය කළ හැකි) | 01 |
| ටියුබ් ලයිට් කේස් (ලොකු) | 03 |
| යකඩ ටැප් | 01 |

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

දෙපාර්තමේන්තුව සතු වෑන් රථය 2010 මැයි 25 දින සිට දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණු බව නිරීක්ෂණය විය.

**(ඇ) ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීම**

මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂයේදී වැය විෂයන් 49කට සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.48,764,710 ක බැරකම් වලට එළඹ තිබුණි.

## 2.6 අනුකූල නොවීම

-----------------

**නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

---------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| | XII වන පරිච්ඡේදයේ 1 වගන්තිය | ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි සේවකයන් නිවාඩු අයදුම් කිරීමකින් තොරව රාජකාරියට වාර්තා නොකරන ලද අවස්ථා පැවතුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මුදල් රෙගුලාසි 104 | (අ) පල්ලේකැලේ ඔසු උයන් භූමියේ හානි වී තිබූ සඳුන් ගසේ මුළු බර කිලෝ ග්‍රෑම් 63 ක් වූ අතර මේ සම්බන්ධයෙන් බලගොල්ල පොලිස් ස්ථානයේ පැමිණිලි අංක 09/91/M01B යටතේ පැමිණිල්ලක් කර ඇති නමුත් විගණිත දින වූ 2013 නොවැම්බර් 05 දින වන විටත් පොලිස් පරීක්ෂණ අවසන් වී නොතිබුණි.<br><br>මෙම හානිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කටයුතු කර විගණකාධිපතිවරයා වෙත වර්තා කර නොතිබුණි. |

(ආ) දෙපාර්තමේන්තුව 2013 ජනවාරි 05 දින අනතුරට පත් වාහනය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. 2013 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ වාහනවලට සිදුවූ අනතුරු සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා වෙත වාර්තා කර නොතිබුණි.

## 2.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම, ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

### (අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ යුතු වූ දිනය | ආරම්භ නොකිරීමට හේතු කෙටියෙන් |
|---|---|---|---|
| | රු.මිලියන | | |
| බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල් සංකීරණය II වන අදියර | 115 | 2013 මැයි | මිල විචලනය සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අනුමැතිය ගත යුතුව ඇත. |
| යක්කල ආයුර්වේද රෝහල සංවර්ධනය කිරීම යටතේ තට්ටු 10කින් යුත් ගොඩනැගිල්ලක් ඉදි කිරීම | 15 | 2013 ජූලි | විද්‍යාතනය සඳහා වෙන් වී ඇති ඉඩමෙන් අක්කර 4 ක භූමි ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා එකඟතාව ලබා ගැනිමට කටයුතු කරමින් පවතී |
| නාවින්න පර්යේෂණ රෝහලෙහි පස් මහල් ගොඩනැගිල්ල ඉදි කිරීම | 15 | 2013 පෙබරවාරි | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා දී නොතිබුණි. |
| පට්ටිපොල ඔසු උයනේ මුළුතැන්ගෙය ඉදි කිරීමේ II වන අදියර | 3 | 2013 මාර්තු | නව සැලැසුමට අනුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවක් ලබා |

| | | | |
|---|---|---|---|
| | | | ගැනීමට කටයුතු කරමින් පවතී. |
| කන්නෙලිය ඔසු උයනේ සංචාරක නිල නිවස ඉදි කිරීම | 4 | 2013 මාර්තු | ඉදිකිරීම සඳහා කටයුතු කර නොතිබුණි. |

**(ආ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

--------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | නිම කළ දිනය | 2013 දෙසැම්බර් 31 දින වනවිට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|
| | රු. මිලියන | | | | රු. | |
| ප්‍රධාන කාර්යාලයේ රියදුරු විවේකාගාරය ඉදි කිරීම | 3.00 | 2013 ජනවාරි | 2013 ඔක්තෝබර් | නිමකර නොමැත | 643,331 ( සියයට 24 ක් පමණ නිමකර තිබුණි.) | ඉදිරිපත් කර නොමැත |
| අම්පාර ආයුර්වේද රෝහලේ වැඩිහිටි වාට්ටුවේ කොරිඩෝව ඉදි කිරීම | 0.68 | 2013 ජනවාරි | 2013 ජූලි | නිමකර නොමැත | | කොන්ත්‍රාත්තුව පිරිනමා ඇත |
| දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ ආපන ශාලාව සමග ශ්‍රවණාගාරය සහ වැසිකිලි පද්ධතිය ඉදි කිරීමේ II වන අදියර | 7.50 | 2013 ජනවාරි | 2013 සැප්තැම්බර් | නිමකර නොමැත | 1,813,866 ( සියයට 60 ක් පමණ නිමකර තිබුණි) | ඉදිරිපත් කර නොමැත |
| හල්දුම්මුල්ල ඔසු උයනේ සේවක විවේකාගාරය ඉදි කිරීම | 4.00 | 2013 පෙබරවාරි | 2013 දෙසැම්බර් | නිමකර නොමැත | ( සියයට 60 ක් පමණ නිමකර ඇත) | ඉදිරිපත් කර නොමැත |
| ගිරාදුරුකෝට්ටේ ශ්‍රවණාගාරය ඉදි කිරීම | 3.00 | 2013 මාර්තු | 2013 දෙසැම්බර් | 2014 නොවැම්බර් වන විටද අවසන් කර නොමැත | 3,493,961 | ඉදිරිපත් කර නොමැත |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ගිරාදුරුකෝට්ටෙ උද්‍යාන කොන්දොස්තර නිල නිවස ඉදි කිරීම | 4.00 | 2013 මාර්තු | 2013 නොවැම්බර් | 2014 නොවැම්බර් වන විටද අවසන් කර නොමැත | 2,208,368 | ඉදිරිපත් කර නොමැත |
| හල්දුම්මුල්ල ඔසු උයනේ මායිම් වැට ඉදි කිරීම II වන අදියර | 3.00 | 2013 ජනවාරි | 2013 ජූලි | ඉදිරිපත් කර නොමැත | 2,394,010 | ඉදිරිපත් කර නොමැත |

## 2.8 කාර්යසාධනය

----------------

2013 ක්‍රියාකාරි සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

-----------------------------------------------

දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) යක්කල ආයුර්වේද රෝහලේ ගබඩාව හා පොදු ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමේ කටයුතු 2013 ජූලි මාසයේදී අවසන් කිරීමට සැලැසුම් කර තිබුණ ද 2013 වර්ෂය අවසන් වන විටත් එය නිම කර නොතිබුණි.

(ආ) අම්පාර ආයුර්වේද රෝහලේ නිෂ්පාදනාගාරයේ වහලය අළුත්වැඩියා කිරීමේ කටයුතු 2013 අගෝස්තු මාසයේ දී අවසන් කිරීමට සැලැසුම් කර තිබුණද 2013 වර්ෂය අවසන් වන විටත් එය නිම කර නොතිබුණි.

(ඇ) මන්වන්තුඩුව රෝහලේ බාහිර රෝගී අංශයේ වහලය අළුත්වැඩියා කිරීම 2013 නොවැම්බර් මාසයේ දී අවසන් කිරීමට සැලැසුම් කර තිබුණද 2013 වර්ෂයේ දී එම කාර්යය ඉටු කර නොතිබුණි.

(ඈ) ප්‍රධාන කාර්යාලයේ පිවිසුම් දොරටුව සහ කාර්යාලයේ අළුත්වැඩියා කටයුතු 2013 ඔක්තෝබර් මාසයේ දී අවසන් කිරීමට සැලැසුම් කර තිබුණ ද 2013 වර්ෂයේ දී එම කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ඉ) හල්දුම්මුල්ල ඔසු උයනේ සංචාරක නිවාසයේ වහලය අළුත්වැඩියාව සහ තීන්ත ආලේප කිරීම හා කාර්යාල ගොඩනැගිල්ල අළුත්වැඩියාවන් 2013 සැප්තැම්බර් මාසයේ දී අවසන් කිරීමට සැලැසුම් කර තිබුණද එම කාර්යය 2013 වර්ෂයේ දී අවසන් කර නොතිබුණි.

## 2.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------

දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) යක්කල ආයුර්වේද රෝහලට අමු හා වියළි ආහාර සැපයීමේ කොන්ත්‍රාත්තුව පිළිබඳ පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ටෙන්ඩර් ඉල්ලුම් පත්‍රයේ ආහාර වර්ග 159 ක් සඳහා මිල ගණන් කැඳවා තිබුණද කොන්ත්‍රාත්තුව පිරිනැමූ සැපයුම්කරු එම ආහාර වර්ග අතරින් 41 කට මිල ගණන් ඉදිරිපත් කර නොතිබුණි. ඉදිරිපත් නොකළ ආහාර වර්ග වෙළඳපලේ වැඩි වියදමක් වන අයිතම විය.

(ii) ප්‍රසම්පාදන කොන්දේසි අංක 16 අනුව යම් ආහාර ද්‍රව්‍යයක් පිළිබඳ ඉදිරිපත් කරනු ලබන මිල ගණන් වෙළෙඳපළේ පවතින මිල ගණන් අනුව විශ්වාසනීයත්වය නොවන තරමට අවම වූ කල්හි එබඳු මිල ගණන් සඳහන් ලංසුව ප්‍රතික්ෂේප කිරිමේ බලය ප්‍රසම්පාදන කමිටුව සතු වුවද, යක්කල ආයුර්වේද රෝහලට ආහාර සැපයිමේ කොන්ත්‍රාත්තුව ලබාගත් සැපයුම්කරු එසේ අසාමාන්‍ය මිල ගණන් ඉදිරිපත් කර තිබුණි.

(iii) අමු වියළි ආහාර සැපයිම සඳහා වන තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ කිරිම සඳහා වූ හේතු යටතේ ඔහු විසින් ආහාර වර්ග කීහිපයක මිල ගණන් ලබා දී නොමැති බැවින් එම ආහාරවල තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මිල ගණන් ඇතුළත් කර තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුව සැපයුම්කරු ඉදිරිපත් නොකළ ආහාර වර්ග 41 ට මිල ගණන් ඉදිරිපත් කළ පදනම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iv) තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ ලංසුකරු විසින් සමස්ථ ප්‍රසම්පාදනයේම අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණු බව දක්වා තිබුණද, ලංසුකරු මිල ගණන් ඉදිරිපත් කර ඇති ආහාර වර්ග ප්‍රමාණය පමණක් සළකා බැලූ විට අවම මිල වෙනත් ලංසුකරුවෙකු විසින් ඉදිරිපත් කර තිබුණි.

(v) සමාගමක් විසින් ඉදිරිපත් කර තිබුණු බිල්පත් අනුව ගෙවිය යුතු එකතුව රු.427,788 ක් වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් 2014 ජනවාරි 27 දින

රු.527,788 ක් ගෙවා තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් රු.100,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 2.10 අවිධිමත් ගනුදෙනු

-------------------

බොරැල්ල රෝහලේ තෙල් සෑදීම සඳහා වියළි ඖෂධ ගබඩාවෙන් මූලිකව ලබා ගත් තෙල් ප්‍රමාණය සහ එයට වෙනත් විවිධ ඖෂධ වර්ගද යොදා ඖෂධීය තෙල් වර්ගය නිෂ්පාදනය කරන විට, එසේ සාදන තෙල් ප්‍රමාණය ලබා ගත් මූලික තෙල් ප්‍රමාණයට ආසන්න වශයෙන් හෝ සමාන විය යුතු වුවත්, තෛල අංශයේ 2013 වර්ෂයේ සෑදූ ඇතැම් තෙල් වර්ග නිමි ඖෂධ ගබඩාවට භාර දෙන විට ලබාගත් මූලික තෙල් ප්‍රමාණයටත් වඩා අසාමාන්‍ය ලෙස අඩු තෙල් ප්‍රමාණයක් ලබා දී තිබුණු බව තෛල අංශයේ ලේඛන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

## 2.11 පාඩු හා හානි

--------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) වියලි ඖෂධ ගබඩාවේ තිබූ වියලි ඖෂධ තොගයේ භෞතිකව හා පොත්වලට ඇතුළත් තොගය අතර වෙනස්කම් නිරීක්ෂණය විය

(ආ) විගණිත දිනය වූ 2014 අගෝස්තු 08 දින වන විට නිමි ඖෂධ ගබඩාවේ ගබඩා කර තිබූ, කල් ඉකුත් වන දිනය පිළිවෙලින් 2012 ජූලි, 2014 පෙබරවාරි, 2011 ජූනි 30, 2011 ඔක්තෝබර්, 2012 ඔක්තෝබර් ලෙස වූ සිරප් වාසක, නව කාර්ෂක ක්වාථ, කටිඵලාදී චූර්ණය, මුණ්ඩි (මඩමහන) අර්කය, සුරනිම්භ, මේදහර අර්කය, දන්ත්‍යාරිෂ්ඨය යන කල් ඉකුත් වූ ඖෂධ වල වටිනාකම රු.9,615 ක් වී තිබුණි.

(ඇ) කල් ඉකුත් වීමට පෙර එම ඖෂධ ආයුර්වේද රෝහලකට හෝ භාර දීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) නිමි ඖෂධ ගබඩාවේ භෞතික තොග ශේෂය සහ පොත් අගය අතර වෙනස්කම් නිරීක්ෂණය විය.

(ඉ) නිමි ඖෂධ ගබඩාව තුළ සුදුසු පරිදි ගබඩා නොකිරීම නිසා චීන කටු 60,000 ක් පමණ ප්‍රයෝජනයට ගත නොහැකි වී තිබුණි. එම තොගයේ වටිනාකම රු.592,000ක් විය.

**2.12** අනාර්ථික ගනුදෙනු
--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 මාර්තු 01 දිනට පෙර බොරැල්ල ආයුර්වේද රෝහලේ වියලි ඖෂධ ගබඩාව සඳහාද, මුළුතැන්ගෙයට රු.60 ක මිලට ලබා ගන්නා මි.ලි. 500 කල් කිරි බෝතල් ලබා ගෙන තිබුණු නමුත් එදින සිට වෙනත් සැපයුම්කරුවකුගෙන් එක් බෝතලයක් රු. 150 බැගින් වියලි ඖෂධ ගබඩාව සඳහා (2012 හා 2013 වර්ෂ සඳහා කිරි බෝතල් 2517 ක්) මිලදී ගෙන තිබූ අතර ඒ හේතුවෙන් රජයට රු.226,530 ක පාඩුවක් 2012 සහ 2013 වර්ෂවලදී සිදු වී තිබුණි.

(ආ) 2013 වර්ෂය සඳහා බොරැල්ල ආයුර්වේද රෝහලට ආහාර සපයන සමාගම කල්කිරි බෝතලයක් සඳහා රු.47 ක මිලක් ඉදිරිපත් කර තිබුණත්, එම සමාගමෙන් කල්කිරි මිලදී නොගෙන වෙනත් අලෙවි නියෝජිත ආයතනයකින් බෝතලයක් රු.60 බැගින් මිලදී ගැනීම හේතුවෙන් 2013 අගෝස්තු 23 දින වන විට බෝතලයකට රු.13 බැගින් කල්කිරි බෝතල් 8,000 ක් සඳහා රු.104,000ක පාඩුවක් රජයට සිදුවී තිබුණි.

**2.13** කළමනාකරණ දුර්වලතා
---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) බොරැල්ල ආයුර්වේද රෝහලේ ඖෂධ නිෂ්පාදනාගාරයේ භාවිතා වන තරාදි පඩි විගණිත දින වූ 2014 ජනවාරි 01 දින වන විටත් වාර්ෂිකව ලියාපදිංචි කිරීම සහ අළුත්වැඩියා කිරීම සිදු කර නොතිබුණි. එම හේතුවෙන් ඖෂධවල බර ප්‍රමාණයන් වෙනස් වීමෙන් ඖෂධවල විවිධ අක්‍රමිකතා සිදුවිය හැකිව තිබුණි.

(ආ) බොරැල්ල ආයුර්වේද රෝහලට අමු ඖෂධ මිලට ගැනීමේ කොන්ත්‍රාත්තුව ලබාදීමේදී ලංසුකරුවන් ඉදිරිපත් කළ මිල ගණන් අතරින් වැඩිම මිලක් සහිත ඖෂධ වර්ග 100 ක් සඳහා වැඩි මිල ඉදිරිපත් කළ ලංසුකරු තෝරාගෙන තිබුණි.

(ඇ) යක්කල ආයුර්වේද රෝහලේ කල් ඉකුත්වීමේ දිනය ලෙස 2001 පෙබරවාරි සටහන් වූ බටු තෙල් මි.ලි.750 බෝතල් 03 ක් ඉවත් නොකර ගබඩාවේ තබා තිබුණි.

(ඈ) යක්කල ආයුර්වේද රෝහලේ 2013 ක්‍රියාත්මක සැලැස්ම මගින් ගබඩාව අළුත්වැඩියා කරනු ලබන බව දක්වා තිබුණ ද, 2014 ජූනි 19 දිනැති විගණන දිනය වන විටත් එම කාර්යය ඉටු කර නොතිබුණි.

(ඉ) 2013 ජනවාරි 07 දින පැවැති ප්‍රසම්පාදන කමිටුව මගින් හල්දුම්මුල්ල ඔසු උයනේ වීදුරු ගෘහය අළුත්වැඩියාව අත්‍යාවශ්‍ය අළුත්වැඩියාවක් සේ සළකා කඩිනමින් කළ යුතු බැවින්

රු.16,904,160 ක ඇස්තමේන්තුවකට රජයේ කර්මාන්තශාලාව වෙත පැවරීමට තීරණය කර තිබුණි. ඒ සම්බන්ධව පරීක්ෂාවේදි පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i). 2013 ජනවාරි 15 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරිමේ අංක 03/3/5/29 දරන ලිපිය යවා තිබුණු නමුත් එහි කොන්ත්‍රාත් කටයුක්ත ආරම්භ කළ යුතු දිනය සහ කොන්ත්‍රාත් කාල පරිච්ඡේදය නිශ්චිතව සඳහන් කර නොතිබුණි.

(ii). කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව පිළිගත් බවට හෝ ආරම්භ කරනු ලබන හෝ දිනයක් සඳහන් කරමින් කොන්ත්‍රාත් භාර ගැනිමේ ලිපිය ඉදිරිපත් කර නොතිබුණි.

(iii). කොන්ත්‍රාත්තුව නිම කළ අවසන් බව සඳහන් කර තිබුණු කෘෂි විද්‍යාඥවරයාගේ අංක හල්/ඔසු/වගා/02/07 දරන ලිපිය අනුව කොන්ත්‍රාත්තුව සඳහා මාස දහයක කාලයක් ගත වී තිබුණි.

(iv). එම නිසා කඩිනමින් කළයුතු යැයි තිරණය කර ලබා දී තිබුණු මෙම අළුත්වැඩියාව සඳහා දිගු කාලයක් ගත වී තිබුණි.

**(ඊ)** පට්ටිපොල ඔසු උයනේ මායිම් වැට ඉදි කිරීම හා අභ්‍යන්තර මාර්ගය ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් ගිවිසුම්වලට එළඹීමේදී කොන්ත්‍රාත් කාර්යය ප්‍රමාද වුවහොත් ඒ වෙනුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස කොන්ත්‍රාත් වටිනාකමෙන් යම් කිසි ප්‍රතිශතයක් අඩු කිරිමේ කොන්දේසි ගිවිසුමට ඇතුළත් නොකිරීම හේතුවෙන් ප්‍රමාදව අවසන් කළ මෙම කොන්ත්‍රාත් සඳහා ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි

(උ) පල්ලෙකැලේ පර්යේෂණ ඔසු උයනේ පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.200,000 කින් ද, වියදම රු.600,000 කින් ද වැඩි වී තිබුණි. එසේම සෑම වර්ෂයකම ආදායම ඉක්මවා වියදම් කර තිබුණි. 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රු.5,610,137 ක මුදලක් ආදායම ඉක්මවා වියදම් කර තිබුණි.

(ඌ) පල්ලේකැලේ පර්යේෂණ ඔසු උයනෙන් ඖෂධ අමුද්‍රව්‍ය ලෙස ලබාගත හැකි බව නිරීක්ෂණය වූ අතර එම ඖෂධ ආයුර්වේද දෙපාර්තමේන්තුවට, ඒ යටතේ පවතින රෝහල්වලට හෝ වෙනත් ආයතනයකට ලබාගැනීමට 2013 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(එ) පල්ලෙකැලේ ඔසු උයන සතු භූමිය සඳහා ඔප්පු හෝ හිමිකම් පැවරීමක් ආයුර්වේද දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි. එහෙත් මෙම බිම් කොටස ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් සංවර්ධනය කර තිබුණු අතර එම බිම් කොටස් ආයුර්වේද දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) පල්ලේකැලේ ඔසු උයනේ මායිම් වැට නිසි ආකාරයෙන් සකස් කොට නොතිබුණි. එම නිසා අනවසර පුද්ගලයන් ඇතුල්වීමට හැකි වන අතර ඖෂධ පැල හා වටිනා ශාක සොරකම් කිරීමේ අවදානමක් පැවැතුණි.

(ඔ) පසුගිය වසර 4ක කාලය තුළ පැල නිෂ්පාදනය (දල) පහත පරිදි විය.

| | |
|---|---|
| 2010 | 26,257 |
| 2011 | 8,969 |
| 2012 | 13,043 |
| 2013 | 9,631 |

මේ අනුව පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පැල නිෂ්පාදනය 3,412 කින් අඩු වී තිබුණි.

(ඕ) 2013 මැයි 28 දිනැති අංක A/25 956524 දරන නිකුතු නියෝගය මගින් ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් එවා ඇති පරිගණකය විගණිත දිනය වූ 2014 අගෝස්තු 29 දින වන විටත් භාවිතයට නොගෙන, නිෂ්කාර්යව පැවති අතර පරිගණකය භාවිතා කිරීමට අවශ්‍ය මෘදුකාංග ඇතුළත් කර නොතිබීම හේතුවෙන් එය ඵලදායී කාර්යයක් සඳහා භාවිතා කිරීමට නොහැකි තත්ත්වයක පැවතුණි.

(ක) දෙපාර්තමේන්තුව සතුව පර්යේෂණ ඔසු උයන් 2 ක් ( හල්දුම්මුල්ල හා නාවින්න) හා ඔසු උයන් 2 ක් (ගිරාදුරුකෝට්ටේ හා පට්ටිපොල) යන ඔසු උයන්වල ස්ථිර ඖෂධීය ශාඛ පිළිබඳ එක් එක් ඔසු උයනට අයත් ලේඛනයක් පිළියෙල කිරීමේ වැදගත්කම පෙන්වා දුන්නද එවැනි ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

(ග) ආයුර්වේද පර්යේෂණාගාරය සරප් අංශයේ 2014 අගෝස්තු 08 දින සිදු කළ භෞතික මුදල් සත්‍යාපනයේදී සරප් රාජකාරිය ඉටුකරනු ලබන ප්‍රධාන කලමනාකරණ සහකාර භාරයේ රු.62,949 ක මුදලක් තිබුණු අතර ඒ පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(I) ඉහත සඳහන් මුදල තුළ පැල අලෙවි ආදායම, ඉන්ධන අත්තිකාරම්, වෛද්‍යවරියකට ගෙවීමට තිබුණු අත්තිකාරම් සහ සුළු මුදල් ශේෂය ඇතුළත් වන අතර එම මුදල් අදාල කාර්යයයන් සඳහා වෙන වෙනම තබා ගෙන නොතිබුණි.

(II) මුදල් භාර කළමනාකරණ සහකාරවරියගේ පහත මුදල් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

- සේප්පුව පරීක්ෂා කිරීමේදී එහි පෙට්ටියක තිබුණු රු.1,884 ක මුදල
- මේස ලාච්චුවේ තිබුණු රු.700ක මුදල.
- 2014 අගෝස්තු 08 දින වන විට සරප් ළඟ පැවතිය යුතු මුදල් ප්‍රමාණයට වැඩිපුර රු.1,507 ක් තිබුණි.

- අත්තිකාරම් ලබාගෙන එම කාර්යය ඉටු කළ විගසම එම අත්තිකාරම පියවිය යුතු වුවත් 2014 ජූලි 30 දින වෛද්‍යවරියකට ස්ත්‍රී රෝග සායනයට අවශ්‍ය උපකරන මිලදී ගැනීමට ඉල්ලා තිබූ රු.20,000 ක අත්තිකාරම් මුදලක් 2014 අගෝස්තු 08 දින වන විටත් එම වෛද්‍යවරියට නොගෙවා මුදල් භාරකරු භාරයේ නිෂ්කාර්යයව පැවතුණු අතර එම මුදල් දෙපාර්තමේන්තුවට බැදීමටද කටයුතු කර නොතිබුණි.

(ච) ඖෂධ පැල අලෙවි ආදායමෙන් අවසන් වරට 2014 ජුලි 08 දින ප්‍රධාන කාර්යාලයේ රු.22,760 ක් තැන්පත් කර තිබුණි.

(ජ) ඔසු පැල විකිණීමෙන් ලබන අදායම කුවිතාන්සිපත් අංක අනුව ලේඛනයක සටහන්කර ප්‍රධාන කාර්යාලයට බැඳිය යුතු වුවද, 2014 ජනවාරි 24 දිනෙන් පසු ආයතනය එසේ කටයුතු කර නොතිබුණි.

(ඣ) සමාලෝචිත වර්ෂය තුළ ප්‍රධාන කාර්යාලයෙන් ලබාගන්නා ලද කුවිතාන්සි පොත් ලේඛනගත කර නොතිබුණි.

(ත) මුළුතැන්ගෙයි ආහාර ඇණවුම සකස් කිරීම, කොන්ත්‍රාත්කරු ලබාදෙන ආහාර භාර ගැනීම සහ මුළුතැන්ගෙය සඳහා ආහාර නිකුත් කිරීම යන කාර්යයන් සියල්ලම ආහාර නිරීක්ෂක තනතුරෙන් ආවරණය කරනු ලබන උපස්ථායකවරිය විසින් සිදු කරනු ලබන බැවින් මෙහි අභ්‍යන්තර පාලන ක්‍රමවේදය සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

(ද) ආහාර ඇණවුම් කරන ලේඛනයේ මුල් පිටපත සැපයුම්කරු වෙත ලබාදිය යුතු වුවද, විගණන අවස්ථාව වන විට එම පිටපත උපස්ථායකවරිය සතුව පැවතුණි.

## 2.14 කාර්යසාධනය

පසුගිය වර්ෂ 4ක රෝහලේ සායන සඳහා රෝගීන් පැමිණි ආකාරය පහත දැක්වේ.

| වර්ෂය | රෝගීන් සංඛ්‍යාව |
|---|---|
| 2013 | 34,536 |
| 2012 | 39,549 |
| 2011 | 39,075 |
| 2010 | 36,231 |

මීට අතිරේකව 2013 වර්ෂය තුළදී වැඩිහිටි සායන සඳහා රෝගීන් 2,529 ක් පැමිණ තිබුණු අතර ඒ අනුව එම වර්ෂයේ සායන රෝගීන් සංඛ්‍යාව 37,065 ක් විය. පසුගිය වර්ෂ 4ක් තුළදී සායන සඳහා පැමිණෙන රෝගීන් සංඛ්‍යාව අඩු වී තිබුණි.

පසුගිය වර්ෂ 5ක කාලය තුළ රෝහලේ බාහිර රෝගී අංශයට පැමිණි රෝගීන් සංඛ්‍යාව පහත පරිදි විය.

| වර්ෂය | රෝගීන් සංඛ්‍යාව |
|---|---|
| 2013 | 69,897 |
| 2012 | 71,805 |
| 2011 | 72,717 |
| 2010 | 73,170 |
| 2009 | 75,394 |

ඒ අනුව පසුගිය වර්ෂ 5 තුළ බාහිර රෝගී අංශයට රෝගීන් පැමිණීම අඩු වී තිබුණි.

## 2.15 **මානව සම්පත් කළමණාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 256 | 189 | 67 |
| (ii) තෘතීයික මට්ටම | 187 | 83 | 104 |
| (iii) ද්විතීයික මට්ටම | 279 | 211 | 68 |
| (iv) ප්‍රාථමික මට්ටම | 717 | 412 | 305 |
| **එකතුව** | **1,439** | **895** | **544** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 544 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ආ) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු 2013 වර්ෂයේ නිවාඩු 93ක් හා 2014 වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා නිවාඩු 45 ක් ගෙන තිබුණ ද ඔහුට 2013 වර්ෂයේ සම්පූර්ණ වැටුප් හා දීමනා ගෙවා තිබුණි.